# එඩිෂම් බංගලාවේ වාස්තුවිද්‍යාත්මක විමර්ශනයක්

ජී.ඩබ්.එච්.එන්. ගුණවර්ධන[1]

මුඛ්‍ය පද: එඩිෂම් බංගලාව, වාස්තු විද්‍යාව, බ්‍රිතාන්‍ය පාලනය

## හැඳින්වීම

මෙහි දී මාගේ අරමුණ වන්නේ, බ්‍රිතාන්‍ය යුගයේ වාස්තු විද්‍යාව පිළිබඳ අධ්‍යනය කිරීමයි. පර්යේෂණ ගැටලුව ලෙස, බ්‍රිතාන්‍ය යුගයේ අනෙක් නිර්මාණවලට වඩා එඩිෂම් බංගලාව විශේෂ වීමට හේතු ය. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මාළිගාවක් බඳු වූ එඩිෂම් බංගලාව ඉදිකිරීමට පසුබිම් වූ ආකාරය, ඉදිකළ ආකාරය හා වත්මන් තත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් මෙහි දී සිදුකර ඇත.

## ක්‍රමවේදය

මේ සඳහා ද්විතීක මූලාශ්‍රය මගින් තොරතුරු ලබාගත් අතර, ඒ යටතේ, මූලාශ්‍ර පරිශීලනය, අන්තර්ජාලය මගින් හා එඩිෂම් බංගලාව ක්ෂේත්‍ර අධ්‍යනයක් මඟින් තොරතුරු රැස්කර පහත තොරතුරු ඇතුළත් කර ඇත.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

එඩිෂම් බංගලාව 1931 වර්ෂයේ බ්‍රිතාන්‍ය පරිපාලන සමයේ ගොඩනගන ලද සුවිශේෂී බංගලාවකි. මෙය බ්‍රිතාන්‍යයේ සිට 1887 දී අනවසරෙන් පවුම් දහයක් අතැතිව පැමිණ, වතු වැවිලිකරුවෙකු ලෙස පුහුණුවද ලබා, වතු හිමිකරුවෙකුද වී, අවසාන ලෙස ප්‍රමුඛ තේ නිෂ්පාදන ආයතනයක් වන ජෝර්ජ් ස්ටුවර් ආයතනයේ සභාපති ලෙස කටයුතු කරන සමයේ තෝමස් ලෙස්ටර් විල්සන් මහතා ඉදිකරන ලද ඔහුගේ පෞද්ගලික නිවසයි. විලියම් මහතා මෙම බංගලාව ඉදිකිරීමට මෙම ප්‍රදේශයම තෝරාගෙන ඇත්තේ, එතුමා කුඩා කල ජීවත් වූ කෙන්ට් ප්‍රදේශයේ දේශගුණයට බොහෝ සෙයින් සමානව මෙම බංගලාව දැනට පිහිටා ඇති, තංගමලේ රක්ෂිතයේ දේශගුණය සමාන නිසා ය. තම කුඩාකල සිහි වීමට මෙම බංගලාව එඩිෂම් නමින් නම් කළ බවත්, එම ගමේ නිවාස ඉදිකරන ටියුඩර් රාජවංශයේ ගෘහ නිර්මාණ ශිල්පයට අනුව, මෙම බංගලාව ඉදිකර ඇති බව එඩිෂම් බංගලාව පිළිබඳ විස්තර පවසන රොඩ්නි මහතා විසින් පවසන ලදි. මෙම බංගලාව සෑදීමට සියලු ද්‍රව්‍ය විදේශ රටවලින් ආනයනය කළ බව පැවසේ.

---

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
heshininirmani@gmail.com

මෙම බංගලාව නිදන කාමර, පුස්තකාල, කෑම කාමර, මුළුතැන්ගෙය, නානකාමර, සදළුතල ආදී සෑම පහසුකමකින් යුක්තව කාමර හතළිහක් පමණ ඇත.

මෙම බංගලාව සම්පූර්ණයෙන්ම කළුගල් වලින් සාදා ඇත. විශාල ප්‍රමාණයේ මෙම කළු ගල් නැව් මගින් එංගලන්තයෙන් මෙරටට ගෙන්වා, දුම්රිය මාර්ගය ඔස්සේ මෙම ඉඩමට ගෙන්වාගෙන ඇති බව ජනප්‍රවාදයේ පැවසෙන බව එඩිෂම් බංගලාව පිළිබඳ විස්තර පවසන රොඩ්නි මහතා විසින් පවසන ලදි. මෙහි වහල තේක්ක උළුවලින් ආවරණය කර ඇත. වහල සෑදීමේ දී අවට දේශගුණ තත්වයන් පිළිබඳ මනාව සිතා බලා ඇත. එනම්, මෙම බංගලාව පිහිටි භූමියේ දේශගුණය දවසට වැඩිවාර ගණනක් වෙනස් වේ. සුළං කපොල්ලක පිහිටා ඇති මෙම බංගලාවේ වහල නැම්මක් ඇතිව ඉදිකර ඇති නිසා, සුළං හේතුවෙන් වහලට සිදුවන හානිය වළකා ඇත. විලියම් මහතා මෙම බංගලාව ඉදිකිරීමට දේශීය පුද්ගලයන්ට භාරදුන් බව පැවසේ. ඊට හේතුව තමන්ට වඩා මෙම ප්‍රදේශයේ දේශගුණ තත්වයන් ආදිය දේශීයන් දන්නා නිසා ය. මෙම බංගලාවේ වහලයේ සුළං ධාරා බංගලාව ඇතුළට ගෙනයාමට සුළං කවුළු පංකා සහිතව කිහිපයක්ම පිහිටා ඇත. එතුළින් බංගලාව ඇතුළත් සිසිලස කිරීමට සේම උණුසුම් කිරීමටත් හැකියාව තිබේ.

ඇතුළත උණුසුම් කිරීමට උදුන් සාදා ඇත. ස්කොට්ලන්තයෙන් ආනයනය කරන ලද, ගල්වලින් මෙම උදුන් සාදා ඇත. වහලයේ ඇති සුළං කවුළු මගින්, උදුන් වෙත ඍජුවම සුළං රැගෙන ගොස් උදුනේ ඇති අඟුරු අයාසයකින් තොරව දැල්වීමෙන් තබා ගනී. මෙම උඳුන් සෑම කාමරයකම ඇත. බංගලාව මහල් දෙකකින් සමන්විත වන අතර, බිම් මහලේ බිම ලී අතුරා ඇත. මෙම ලී ඇතුරුමට යටින් බංගලාවේ විදුලිය සැපයීමට අවශ්‍ය වයර් ගමන් කරයි. බිම් මහල සහ උඩුමහල අතර, පැරිස් බදාම තට්ටුවක් ඇති අතර, ඊට උඩින් නැවත ලී තට්ටුවක් ඇත. ලී තට්ටුව හා පැරිස් බදාම තට්ටුව අතර, උඩුමහලේ විදුලිය සැපයීමට අවශ්‍ය වයර් ගමන් කරයි.

මෙම බංගලාවේ විශේෂිතම අංගයක් ලෙස, ඉහළට නැගීමේ පඩිපෙළ හඳුන්වාදිය හැකි ය. මෙම පඩිපෙළ මධ්‍යයේ එංගලන්තයෙන් ආනයනය කරන ලද, ඕක් ගස් සතරක් සිටුවා ඇත. මෙම ඕක් ගස් සතර බංගලාවේ මුළු වහලයේම බර දරා සිටී. දැනට ලංකාවේ ඇති පැරණිතම ඕක් ගස් සතර ලෙස, මෙය හඳුන්වනු ලබයි. බකිංහැම් මාළිගාවේ පඩිපෙළ ආකාරයට මෙහි පඩිපෙළ සාදා ඇත. බංගලාවට විදුලිය ලබාගෙන තිබෙන්නේ, ජෙනරේටරයක් මඟිනි. බංගලාවේ සෑම කාමරයකටම උණු ජලය පහ ඇති බොයිලේරුව මඟින් යවනු ලබයි. ගල් අඟුරු වලින් මෙම බොයිලේරුව එකල ක්‍රියාත්මක වී ඇත.

මෙම බංගලාව ඉදිකිරීමේ දී විලියම් මහතා තම රියදුරු සඳහා ද වෙනම කොටසක් ඉදිකර ඇත. විල් මොරිසන් එකල විලියම් මහතාගේ රියදුරු වූ අතර, මෙම කොටසත් මහල් දෙකකින් යුක්ත වේ. පහළ කොටසේ වාහන, අශ්ව කරත්ත ආදිය ගාල් කර තැබීමටත් උඩු මහල රියදුරු සඳහා වෙන් කර ඇත. එහි සියලු

පහසුකම් වලින් යුක්ත ය. මුළුතැන්ගෙයක්, නිදන කාමර, නාන කාමර ආදියෙන් යුක්ත ය. බංගලාවේ ඇතුළත චිත්‍රවලින් අලංකරණය කර ඇත. තෝමස් මහතාගේ බිරිඳ චිත්‍ර ශිල්පිණියක් වීම ඊට හේතුවයි. ලංකාව චිත්‍ර පහළවකින් තමන් දකින ආකාරය ඇය ඇඳ ඇත. එම චිත්‍ර අදටත් බංගලාවේ දක්නට ඇත.

1949 දී ජෝර්ජ් ස්ටුවඩ් ආයතනයෙන් විශ්‍රාමගත් තෝමස් මහතා, මෙම බංගලාව ගෘහ භාණ්ඩත් සමගම සේදවත්ත කම්හල හිමි විමලා විජේවර්ධනට අලෙවි කර, තම මව් රටට ගිය බව විස්තර විචාරයේදී රොඩ්නි මහතා පවසන ලදි. පසුව 1961 දී රෝමානු කතෝලික පල්ලියට මෙම ඇඩ්ෂම් බංගලාව හා භූමිය අයිති වී ඇත. මෙය අදවන විට ශාන්ත බෙනඩික් තාපසාරාමය ලෙස හඳුන්වයි. තාපසවරුන් පුහුණු කරන ස්ථානයකි. විශාල සංචාරක ආකර්ශණයක් දිනා ඇති මෙහි කොටසක් දෙස් විදෙස් සංචාරකයන්ට නැරඹීමට වෙන් කර ඇත. අනෙක් කොටස ලෙස තාපසාරාමය පවත්වාගෙන යයි. රියදුරු සඳහා වෙන් කළ කොටස් අද වන විට නවාතැන් පහසුකම් ගත හැකි කොටසක් ලෙස පවත්වාගෙන යයි. කාමර අටක් ඒ සඳහා වෙන් කර ඇත. ඊට අමතරව තාපසවරුන් විසින් මෙම භූමියේ පළතුරු වගාකොට ඒවායෙන් ජෑම් නිශ්පාදනාගරයක් පවත්වාගෙන යයි. එතුලින් ඒ අවට ජනයාට සුළු රැකියා අවස්ථාවක් ද උදා වී ඇත. එමෙන්ම සත්ව ගොවිපලක් ද මෙහි ඇත. ජෑම් අලෙවි කිරීම සඳහා පෙර වාහන හා අශ්ව කරත්ත ගාල් කළ කොටස වෙන් කර ඇත. ඉතා අලංකරණ ලෙස, සංචාරක ආකර්ශණයක් දිනා ගත් ස්ථානයක් බවට පත් කිරීමට තාපසවරුන් ගන්නා උත්සහය අති සාර්ථක ය.

**සමාලෝචනය**

ඉහත සඳහන් කරුණු අනුව, බංගලාව ඉදිකිරීමට පසුබිම් වූ ආකාරය, ඉදිකළ ආකාරය, ගෘහ නිර්මාණ ශිල්පය, ඇතුළත අංග හා වත්මන් තත්වය පිළිබඳ මනාව පැහැදිලි වේ. මෙම බංගලාව අති විශිෂ්ට ලෙස, වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ඇතිව නිර්මාණය කර ඇත. බංගලාවට එක් කර ඇති සියලුම අංග විශේෂ හේතුන් මත එක් කර ඇති බව පැහැදිලි ය. ස්වභාවික පරිසරයට උචිත ආකාරයට මෙය නිර්මාණය කර ඇති බව බංගලාව නිරීක්ෂණය කිරීමේ දී පැහැදිලි වේ. එමෙන්ම දේශගුණයට උචිත ආකාරයට නිර්මාණය කර ඇත. බංගලාව ඇතුළ ද අති සුඛෝපබෝගී ලෙස නිර්මාණය කර ඇත. මාළිගාවක් ආකාරයට මෙහි ඇතුළද වාස්තු විද්‍යාව භාවිතා කර ඇති බව ඉහත විස්තරයෙන් පැහැදිලි වේ. වාස්තු විද්‍යාත්මක ලක්ෂණ බොහෝ සෙයින් දේශීය වාස්තු විද්‍යාවට වඩා විදේශීය වාස්තු විද්‍යාවට සමාන බව පැහැදිලි වේ.

**ආශ්‍රිත මූලාශ්‍රය**

සුලිවන්, එඩ්වඩ්. (19 සියවස) The Bangalow and the Tent: or a visit to Ceylon https://www.youtube.com/watch?v=fHzQucGQNrQ&t=568s (online)